පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- පෙරදිග සංගීතය

සතිය - 6

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# මයිනර් කෝඩ්ස් (Minor Chords) ගොඩ නගමු

- ඔබ කැමති ස්වරයක් මුල් කරගෙන පිළිවෙලට ස්වර 8ක් ලියන්න. (මෙය ස්වර 12 පිළිවෙලට ලියන ආකාරයට විය යුතුය)

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|
| ස | රි | රි | ග | ග | ම | ම’ | ප |
| C | $C^{\#}$ | D | $D^{\#}$ | E | F | $F^{\#}$ | G |
| C | $D^{b}$ | D | $E^{b}$ | E | F | $F^{\#}$ | G |

- බටහිර සංගීතයට අනුව ආරෝහණ ස්වර ලිවීමේදී හඬ වැඩි යන අර්ථයෙන් Sharp (#) ලෙසත්, අවරෝහණ ස්වර ලිවීමේදී හඬ අඩු යන අර්ථයෙන් Flat (b) ලෙසත් නම් කෙරේ.
- ඉහතින් දක්වා ඇති ස්වර 8න් **1,4,8**, යන අංක වලට හිමි ස්වර ලබා ගැනීමෙන් Minor Chord එකක් ලබා ගත හැක.

ඒ අනුව        ස   ගු   ප

C  E  G = $C^m$  ලෙස දැක්විය හැක.

- Minor Chord එකක් නම් කිරීමේදී අනිවාර්යයෙන්ම ස්වරයට ඉදිරියෙන් Simple " m "යෙදිය යුතුය. එනම් $F^m$ ,$G^m$ වශයෙනි.
- Major Chord එකක් ලබා ගැනීමේදී **1,5,8** අංක වලට හිමි ස්වර යොදාගත් අතර, Minor Chord එකකදී **1,4,8** යන අංක වලට හිමි ස්වර යොදා ගැනේ.
- මෙහිදී 1 වන ස්වරය සහ 8 වන ස්වරයත් ස්ථාවරව පවතිද්දී මැද ස්වරය පමණක් වෙනස් වේ.

එනම් -: Major Chord එකකදී 5 වන ස්වරයත්

Minor Chord එකකදී 4 වන ස්වරයත් භාවිතා වේ.

පැවරුම

1. ප්‍රධාන ස්වර 7 මුල් කර ගනිමින් Minor Chords ගොඩ නගන්න.
2. C Major (C), C Minor ($C^m$) වශයෙන් ඔබ ගොඩනැගූ Major, Minor Chords ස්වර පුවරුවකින් වාදනය කර හඬෙහි වෙනස වටහා ගන්න.